ජලජ අලංකරණය යනු, ජීවී හා අජීවී වස්තූන් භාවිතා කරමින් සුරතල් මසුන් ඇති කරනා ටැංකියක හෝ පොකුණක අවකාශය, කලින් තීරණය කොටගත් භූමි දර්ශනයකට අනුකූලව අලංකරණය කිරීමයි. මේ සඳහා භාවිතා කරන බොහොමයක් ශාක නිවර්තන කලාපය සිය නිජ භූමිය කොට ගත් ශාක වේ. ඒ අතුරින් Anubias සහ Cryptocoryne සුවිශේෂී ස්ථානයක් අත් කරගෙන ඇත. මෙම විශේෂයන් දෙක සඳහා ඉහළ ඉල්ලුමක් ලෝක වෙළඳපොළ තුළ ඇත.



*Anubias spp*



*Cryptocoryne spp*

Anubias බටහිර අප්‍රිකාව නිජබිම කොටගත් ශාකයකි. Cryptocoryne විශේෂ 14ක් ශ්‍රී ලංකාවට ආවේණිකය. මෙම ගණයන් දෙකම, ඇන්තුරියම්, ඩීෆන්බකියා වැනි ඒක බීජ පත්‍රී ශාක අයත් ශාක පවුලක් වන Araceae පවුලට අයත් වේ.

Anubias විශේෂ සඳහා නව පත්‍රයක් ඇතිවීමට ගතවන කාලය විශාල වීමත්, ස්වාභාවික පරිසරයේ වර්ධනය වන ශාකවලට සාපේක්ෂව වගා කරන ලද Cryptocoryne

ශාක පත්‍ර කුඩා වීමත්, මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින වගාකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු වේ. මෙම ගැටළු ද්විත්වයම ශාක වර්ධනය හා සම්බන්ධිත ය. නමුත් මෙම ගැටළු සඳහා සිදු කර ඇති පර්යේෂණයන් ගණන ඉතා අල්පය.

ශාක වර්ධනය ප්‍රධාන වශයෙන්ම ජානමය හා පාරිසරික සාධක මත රඳා පවතී. ආලෝකය, උෂ්ණත්වය හා පෝෂක ප්‍රධාන පාරිසරික සාධක වේ. ඒ අතුරින් ආලෝකය හා පෝෂක වල බලපෑම ශ්‍රී ලාංකික ආරක්ෂිත ගෘහ තත්ව යටතේ පහසුවෙන්ම පාලනය කළ හැක. මෙම පර්යේෂණය මූල පෝෂක ද්‍රාවන 4ක් සහ පත්‍ර පෝෂක ද්‍රාවන 3ක් යොදාගෙන ඇත. ජල රෝපිත වගා ක්‍රම යටතේ විශේෂයන් දෙක සඳහා වෙන් වෙන්ව පරීක්ෂණ සිදු කරන ලදී. මීට අමතරව, වෙනත් පරීක්ෂණයක් සුදු, රතු, නිල් සහ දීවා ආලෝකය යටතේ එක් ඝනයක විශේෂ 3ක් යොදා ගනිමින් සිදු කරන ලදී.



එහිදී, Cryptocoryne විශේෂ කෙටි කාලයක් තුල ජල ද්‍රාව්‍ය මූල මණ්ඩලය වෙතට මෙන්ම, ශාක පත්‍ර මතට යොදන පොහොර සඳහා පත්‍ර රෝපිත වර්ගඵලය, පත්‍ර දිග, පත්‍ර පළල හා පත්‍ර සංඛ්‍යාව වෙනස් වීම් මගින් ප්‍රතිචාර දක්වයි. එසේම ආලෝකයේ වෙනස්වීම්වලට ද කෙටි කාලයක් තුල ප්‍රතිචාර දක්වයි. මෙම ශාකයේ විශේෂත්වය වනුයේ ශාක පත්‍ර ඉතා සියුමැලිවීම යි.

මෙහිදී, Anubias විශේෂ ශාක පෝෂක වලට මෙන්ම ආලෝකයේ වෙනස්වීම් වලට ද කෙටි කාලයක් තුල ප්‍රතිචාර නොදක්වන බව පෙනී ගියේය. 'බමඉසී විශේෂ සාපේක්ෂව ඉතා අඩු වර්ධන වේගයක් පෙන්නුම් කිරීම මෙයට හේතුව ලෙස දැක්විය හැක.

This is a non-technical summary of the project report titled "Enhancing Leaf Growth and Development in *Anubias* and *Cryptocoryne* by Controlling Growth Environment" supervised by Prof. C.K. Benaragama*, Department of Crop Science, Faculty of Agriculture, University of Peradeniya.

chalindab@gmail.com



# බහුදින ධීවර යාත්‍රාවල මාළු නැවුම් ද......?

රේෂාන් ප්‍රනාන්දු

ශ්‍රී ලංකාව දූපතකි, අප රටට අයත් භූමි ප්‍රමාණයට වඩා අපට අයත් සාගර ප්‍රමාණය විශාල වේ. රට තුළට මසුන් ගෙන එන ප්‍රධාන ආකාරයක් වන්නේ බහුදින ධීවර යාත්‍රාය. මේවා දින 25ත් 35ත් අතර කාලයක් මහ මුහුදේ මසුන් ඇල්ලීම සිදුකරයි. මෑත කාලයේ දී නම් අපට බහුදින ධීවර යාත්‍රා ගැන නිතර අසන්නට ලැබුණේ ලංකාවට විශාල වශයෙන් මත්ද්‍රව්‍ය රැගෙන එන ජාවාරම් නිසාය. ලංකාව දූපතක් වුවත් අපට තිබෙන ප්‍රධාන ගැටළුවක් නම් නැවුම් සහ ගුණාත්මක මාළු මිලදී ගැනීමට නොහැකිවීමයි. බොහෝ පුද්ගලයන් මැසිවිලි නගන්නේ ගෙවන මුදලට සාපේක්ෂව මාළු වල නැවුම්බව සහ ගුණාත්මකභාවය ඉතාමත් අඩු බවයි.



මෙලෙස මසුන්ගේ නැවුම් බව සහ ගුණාත්මකභාවය ඉතාමත් අඩු බව නොරහසක් වුවත් ඒවා නිවැරදිව යාමනය කිරීමට ධීවර අමාත්‍යාංශය සහ ඊට අදාළ රාජ්‍ය ආයතනය තුළ නිශ්චිත රාජ්‍ය ප්‍රතිපත්තියක් තවමත් නිර්මාණය වී නොමැත. එවන් පසුබිමක ලංකාව වටා වූ මුහුදු තීරයේ පවතින ධීවර වරායන් විසි එකෙන් ප්‍රධානම ධීවර වරායන් තුනක් වන බේරුවල, කුඩාවැල්ල සහ දික්ඕවිට යන ධීවර වරායන් තුන යොදා ගෙන සිදු කළ සමීක්ෂණයකින් තහවුරු වූයේ දේශීය පරිභෝජනය සඳහා යොදා ගන්නා මත්ස්‍යයන්ගේ ගුණාත්මකබව සහ

සෞඛ්‍යාරක්ෂිත බව ඉතා අඩු මට්ටමක පවතින බවය. නමුත් විදේශ රටවලට අපනයනය කරන මසුන්ගේ ගුණාත්මක බව සහ සෞඛ්‍යාරක්ෂිත බව ඉතා හොඳ තත්වයේ පවතී.

තවදුරටත් ඉහත සමීක්ෂණයෙන් පෙන්නුම් කරනුයේ මසුන්ගේ ගුණාත්මක බව සහ සෞඛ්‍යාරක්ෂිත බව අඩු වී ඇත්තේ මසුන් ඇල්ලීම සඳහා යොදා ගන්නා බහුදින ධීවර යාත්‍රා ප්‍රමාණයෙන් කුඩා වීම නිසාත් ප්‍රමාණයට වඩා වැඩි මසුන් ප්‍රමාණයක් රැගෙන එන නිසාත් මසුන් තෙරපීකට ලක්වීම සිදුවේ, තව ද මුහුදේ දී අල්ලාගන්නා මසුන් කල්තබා ගැනීමට ප්‍රමාණවත් ලෙස අයිස් භාවිතා නොකිරීම ද, එලෙසම නැවත ධීවර වරායන් වලට පැමිණි පසු එම මසුන් බහුදින ධීවර යාත්‍රා තුළ සිට ගොඩබෑම සිදු කිරීමේදී ඉතාමත් අපරික්ෂාකාරී ලෙස ධීවරයන් කටයුතු කිරීම ද තවදුරටත් මෙම ගුණාත්මක බව සහ සෞඛ්‍යාරක්ෂිත බව අඩුවී යාමට හේතු වේ. මවිතයට ලක් වන කරුණ නම් දේශීය පාරිභෝගිකයාට ඇති මාළු වල ගුණාත්මකභාවය සහ සෞඛ්‍යාරක්ෂිත බව ඉතා පහළ මට්ටමක පැවතුනද ලංකාව මේ වන විටත් විදේශ රටවලට මසුන් අපනයනය කරන ප්‍රධාන රටක් බවට නම් දරා ඇත. පිටරටට එක් ආකාරයකටත් දේශීය මිනිසුන්ට තව ආකාරයකටත් මසුන් සැපයුම සිදුකරන මෙම ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ධීවර අමාත්‍යාංශයේ වගකිවයුතු බලධාරීන් වහාම ක්‍රියාත්මක විය යුතු නොවේද?

This is a non-technical summary of the project report titled “Comparative Study on Quality and Safety Aspects of Marine Fishery Chain of Selected Fishery Harbors in Sri Lanka” supervised by Dr. R.P.N.P. Rajapakse*, Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya.
n_rajapakse@yahoo.com



# කුඩා තේ වතු හිමියාගේ නිෂ්පාදන ඉහල නැංවීම වෙනුවෙන් ජංගම කෘෂි උපදේශන සේවා

**සුමුදු වහලතන්ති**

අදින් වසර ගනනාවකට ඉහත ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තයේ හිනිපෙත්තෙහි රැඳුණු රටකි. තවමත් දියුණු වෙමින් පවතින මෙරටෙහි ආර්ථිකය සහ කෘෂිකර්මාන්තය නගාසිටුවිමෙහිලා තේ කර්මාන්තය සැලකිය යුතු කාර්යභාරයක නිරත වෙමින් පවතී. සමස්ත තේ නිෂ්පාදනයෙන් 70% පමණ කුඩා තේ වතු හිමියන් විසින් නිෂ්පාදනය කරනු ලබන අතර සමස්ත තේ ඉඩම් ප්‍රමාණයෙන් 60% පමණ පිහිටා ඇත්තේ පහත රට කලාපයෙහි වේ. එබැවින් පහතරට කුඩා තේ වතු හිමියා යනු තේ කර්මාන්තයෙහි ඉතාමත් සුවිශේෂී චරිතයකි. ‘Ceylon tea’ ලෙස අපනයන වෙළඳපොළෙහි ඉහල නාමයක් දිනාගෙන ඇති තේ කර්මාන්තයෙහි නිෂ්පාදන ඉහල නැංවීමට නම් කුඩා තේ වතු හිමියන් නව දැනුම හා කුසලතා තුලින් පරිපුර්ණ කල යුතුය. කාර්යබහුල ජීවන රටාව සමග ඔවුන් වගාව හා සම්භන්ධව තොරතුරු ලබා දෙන ආයතන සමග පවතින සබඳතා සීමා වෙමින් පවතී. එවැනි තත්වයක් මත ජංගම දුරකථන හරහා කෘෂි උපදේශන ලබා දීම ඉතා පහසු හා කාර්යක්ෂම ක්‍රමයක් බවට පත්ව ඇත.





රාජ්‍ය හා පෞද්ගලික සමාගම් මගින් මේ වන විටත් මෙම උපදේශන සේවා බෙදා හැරීම සිදු වුවද මෙවැනි සේවා සඳහා යොමු වීමේ අඩුවක් කුඩා තේ වතු හිමියන් අතර පවතී. මෙම අධ්‍යයනය තුලින් ඊට හේතු කාරණා විය හැකි පරිශීලකයාට හා සේවාවට අනුබද්ධ ගුණාංග පිලිබඳ සොයා බැලීමක් සිදු කර ඇත.



මේ පිලිබඳ වැඩිදුර අධ්‍යනය පහසුව සඳහා දැනට පවතින පුළුල්ම පෞද්ගලික ජංගම කෘෂි උපදේශන සේවාව වන ගොවි මිතුරු සේවාව භාවිතා කරන ලදී. ගොවි මිතුරු සේවාව සමග අවම වශයෙන් මාස තුනක්වත් රැඳී සිටි කළුතර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 190 දෙනෙකු මෙම අධ්‍යනයට යොදා ගන්න ලදී. එහිදී, පරිශීලකයාට හා සේවාවට අදාළ ගුණාංග පිළිබද ඇතුලත් ප්‍රශ්න මාලවකට තොරතුරු ලබා ගත් අතර ඒ තුලින් සිදු කරන ලද විශ්ලේෂණ හරහා නිගමනයන්ට එළඹිණි. මෙම තොරතුරු ලබාගැනීම පරිශීලකයාගේ ලක්ෂණ හතක් සහ සේවාවේ ලක්ෂණ හතක් යොදා ගනිමින් සිදු කෙරුණි.

ගොවි මිතුරු සේවාව සමග ක්‍රියාශීලි ආකාරයෙන් රැඳී සිටින්නකු වීමට බලපාන කරුණු මෙහෙදී පළමුව අධ්‍යයනය කෙරුණි. මේ අනුව සේවාව භාවිතා කරන කුඩා තේ වතු හිමියන්ගේ අධ්‍යාපන මට්ටම, තේ වගාවේ භුමි ප්‍රමාණය, මාසික තේ වගා ආදායම, සේවාව මගින් ලබාදෙන තොරතුරු වල ගුණාත්මක බව, ප්‍රයෝජනවත්භාවය සහ තම වගා කටයුතු සඳහා ලබාදෙන තොරතුරු වල පවතින අදාලත්වය ඉහල යනවිට යම් පරිශීලකයෙකු ක්‍රියාශීලි පරිශීලකයෙකු වීමට පවතින හැකියාව ඉහල යා හැකි බව අනාවරණය විය.

ක්‍රියාශීලිව සේවාව භාවිතා කරන්නෙකු වුවත් ඔහු හෝ ඇය එම සේවාව මගින් තොරතුරු ලබාගෙන තම ආදායම ඉහල නංවා ගන්නා අයෙකු වීමට අපොහොසත් වන්නේ නම් මෙවැනි සේවාවක් භාවිතයෙහි පලක් නැත. එබැවින් මෙම සේවාවෙන් වාසි ලබා ගන්නෙකු බවට පත් වීමට නම් කුමන කාරනා පිලිබඳ වැඩි දුරටත් සිතිය යුතුද යන්න මීලගට අධ්‍යනය කරන ලදී. එහිදී කුඩා තේ වතු හිමියාගේ වයස සහ අත්දැකීම ඉහල යාමත්, තොරතුරුවල පවතින ගුණාත්මක භාවය හා ප්‍රයෝජනවත්භාවය ඉහල යාමත් තුලින් සේවාව හා සම්භන්ධවී වාසි ලබා ගන්නෙකු බවට පත් වීමේ හැකියාව ඉහල යා හැකි බව අනාවරණය විය.

මීට අමතරව සේවාව සම්භන්ධව අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී. ගොවි මිතුරු සේවාව මගින් දවසේ තෝරාගත් ස්ථාපිත කාල සීමාවක දුරකථන ඇමතුමක් ලැබෙනු ඇත. බොහෝ කුඩා තේ වතු හිමියන්ගේ අදහස වුයේ මෙම දුරකථන ඇමතුම ලැබෙන වෙලාව පිලිබඳ ඔවුන් එකඟ නොවන බවයි. එම කාල වෙලාවේ ඔවුන් කාර්ය බහුල බැවින් තොරතුරු ලබා ගැනීම සඳහා පරිශීලකයාට අවශ්‍ය වෙලාවක් ලබා ගත හැකි ලෙස සේවාව දියුණු කල යුතුය යන්න ඔවුන්ගේ මතයයි. ගොවි මිතුරු යනු පෞද්ගලික අංශයට අයත් සේවාවක් බැවින් ඒ සඳහා කුඩා තේ වතු හිමියන්ට දිනකට රුපියලක් සහ බදු මුදලක් අයකරනු ලබයි. නමුත්, ඇතැම් සේවා පරිශීලකයන්ට මේ පිලිබඳ අවබෝධයක් නොතිබුණි. එබැවින් මාසිකව මෙම මුදල් අයකිරීම් පිලිබඳ ඔවුන් දැනුවත් කිරීම සුදුසුය.

මේ අනුව මෙම අධ්‍යනය අවසානයේ ඉතාමත් පැහැදිලිව නිගමනය කල හැක්කේ සේවාවෙහි ගුණාංග වැඩි දියුණු කිරීම තුලින් සහ සේවාවෙන් ලැබෙන තොරතුරු සහ වාසි පිලිබඳ කුඩා තේ වතු හිමියන් වැඩි දුරටත් දැනුවත් කිරීම තුලින් මෙම සේවාව භාවිතය ඉහල නැංවිය හැකි බවයි.

This is a non-technical summary of the project report titled “The Role of User and Service Attributes on Adoption of Mobile Based Agriculture Advisory Services by the Low Country Tea Smallholders in Kalutara District” supervised by Dr. J.M.P.N. Anuradha*, Department of Agricultural Extension, Faculty of Agriculture, University of Peradeniya.
anuradhaj@agri.pdn.ac.lk



# වැලිගම මැලවීමට ගැලවීම කොළ කුන්දිරාද?

කැලුම් පෙරේරා

ශ්‍රී ලංකාවේ දකුණු පළාත ආශ්‍රිත පොල් වගාවට වර්තමානයේ පවතින ප්‍රභලතම අභියෝගය වන්නේ වැලිගම පොල් පත්‍ර මැලවීමේ රෝගයයි. පත්‍ර කහ පැහැති වීමත් පැතලි වීමත් රෝගයේ මූලික ලක්ෂණ වන අතර ක්‍රමයෙන් ගස දුර්වල වීම හා ඵලදාව අඩු වීමත් සිදුවේ. මෙය මහා පරිමාණ පොල් වගාකරුවන්ගේ පමණක් නොව කුඩා පොල්වතු හිමියන්ගේද ආර්ථිකය වෙත දැඩි පහරක් එල්ල කිරීමට සමත් වී ඇත.

රෝග කාරකයා ෆයිටොප්ලාස්මා ලෙස හඳුන්වන ක්ෂුද්‍ර ජීවියෙකි. ශාක සෛලයටත් වඩා කුඩා මෙම ක්ෂුද්‍ර ජීවියා වෙනත් ක්ෂුද්‍ර ජීවීන් මෙන් කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් පාලනය කිරීම ප්‍රායෝගික නොවේ. එමෙන්ම ගෙවත්තකට පොල් ගසක් යනු කප්රුකකි. ඉතා දිගු කාලයක් අස්වැන්න ලබා දෙන බෝගයක් බැවින් රෝගයට ලක් වූ සියලුම ශාක ඉවත්කිරීම ආර්ථික වශයෙන් අහිතකර බැවින් වඩාත් සුදුසුම පාලන ක්‍රමය වන්නේ රෝගයට ප්‍රතිරෝධී පොල් ප්‍රභේද වගා කිරීමයි.

පොල් පර්යේෂණ ආයතනය මගින් සිදුකරන ලද සමීක්ෂණයකට අනුව කොළ කුන්දිරා ලෙස හඳුන්වන කුරු පොල් ප්‍රභේදය වැලිගම පොල් පත්‍ර මැලවීමට ඉතා ඉහළ ප්‍රතිරෝධයක් පෙන්වයි. මේ අනුව, වැලිගම පොල් පත්‍ර මැලවීමට කිසියම් ජානමය ප්‍රතිරෝධයක් කොළ කුන්දිරා තුළ පවතින බවට කල්පිතයක් ගොඩ නැගිය හැකිය.

කොළ කුන්දිරා වානිජ පොල් වගාව සඳහා එතරම් සුදුසු නොවන්නේ අනෙකුත් පොල් ප්‍රභේද හා සසඳන විට එම ප්‍රභේදයේ ඵලය ප්‍රමාණයෙන් ඉතා කුඩා බැවිනි. එසේ නමුත් දකුණු පළාතේ ගෙවතු වල කොළ කුන්දිරා ප්‍රභේදය ඉතා සුලභව දැකියහැකි වන්නේ ඉතා ප්‍රණීත පානයක් වශයෙන් කොළ කුන්දිරා ප්‍රකට බැවිනි.

මෙම අධ්‍යයනය සඳහා වැලිගම, මාතර, දෙනිපිටිය හා කඹුරුගමුව ආශ්‍රිත ගෙවතුවලින් තෝරාගන්නා ලද කොළ කුන්දිරා ශාක තිහක් (30) යොදා ගන්නා ලදී. එම නියැදිය නිරෝගී

ශාක විසි පහකින් (25) සහ වැලිගම මැලවීමට ලක්වූ ශාක පහකින් (5) සමන්විත විය. අධ්‍යයනයේ එක් අරමුණක් නම් දකුණු පළාතේ කොළ කුන්දිරා ශාකවල රූප විද්‍යාත්මක විවිධත්වය අධ්‍යයනය කිරීමයි. අනෙක් අරමුණ නම් අණුක ලකුණුකරණ වර්ග (Molecular markers) භාවිතා කර කොළ කුන්දිරා ශාක අතර ඇති ජාන විවිධත්වය නිරූපණය කිරීමයි. දත්ත විශ්ලේෂණයට අනුව කොළ කුන්දිරා ශාක සියල්ල රූප විද්‍යාත්මකව ඉතා සමානය. කොළ කුන්දිරා ස්ව පරාගනය සිදු කරන ප්‍රභේදයක් බැවින්, ශ්‍රී ලංකාවේ කොළ කුන්දිරා ශාක එකම ගහණයකට අයත් බව මෙයින් තහවුරු වේ.

ජාන විවිධත්වය විශ්ලේෂණය කිරීමේදී රෝග ලක්ෂණ පෙන්නුම් කළ කොළ කුන්දිරා ශාක දෙකක් පමණක් අනෙකුත් කොළ කුන්දිරා ශාක වලින් අපගමනයක් පෙන්නුම් කර ඇත. මෙම අපගමනයට අදාළ අණුක ලකුණුකරණය භාවිතා කර තවදුරටත් කොළ කුන්දිරා ශාක පර්යේෂණයට ලක් කිරීම තුළින් වැලිගම පොල් පත්‍ර මැලවීමට ප්‍රතිරෝධී කුන්දිරා ශාක සහ ප්‍රතිරෝධී නොවන කුන්දිරා ශාක අණුක තාක්ෂණික ක්‍රම මගින් වෙන් කර ගැනීමට හැකි වේ යැයි බලාපොරොත්තු විය හැක.

එමගින් රෝගයට ප්‍රතිරෝධී දෙමුහුම් ප්‍රභේද නිපදවීම වැනි වඩා සුරක්ෂිත පිළියම් වැලිගම මැලවීමෙන් මැලවුණු දකුණු පළාතේ පොල් වගා කරුවන්ගේ හෙට දවස වෙත ලබා දීමට හැකියාවක් ලැබෙනු ඇත.



වැලිගම පොල් පත්‍ර මැලවීමේ රෝගයට ලක් වූ පොල් ගසක්

This is a non-technical summary of the project report titled “DNA Fingerprinting of Green Dwarf Coconut Phenotypes in Southern Sri Lanka in Relation to its Resistance to Weligama Coconut Leaf Wilt Disease” supervised by Dr. S.A.C.N. Perera*, Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya.
chandrikaperera2003@gmail.com



# වැවක්-ඇලක්-දොලක් පිරි හෙටක්; ශ්‍රී ලාංකීය වාරිමාර්ග පද්ධතීන් නඟා සිටුවීමෙහිලා පුරවැසි කාර්යභාරය

**මේනකා රත්නායක**

## අතීතයෙන් වර්තමානයට…

අනුරාධපුර රාජධානි සමයේ පමණක් සිරිලක් මවට දායාද වූ වාරි කර්මාන්ත ගණන සිය ගණනක්. ඒ සියල්ල දැහැමි පාලනයේත්, එකල මිනිසුන්ගේ දෑතේ වීරියේත් පිලිබිඹුවයි.

කාලයාගේ ඇවෑමෙන් ජරා ජීර්ණත්වයට පත් වෙන මේ මහ වැව්, කුඩා වැව් පසු කලෙක විවිධ ස්තර වල බලධරයන් අතින් නඩත්තු වූවත් අද වන විට බොහොමයක් වාරිමාර්ග පද්ධතීන් නඩත්තු වන්නේ ඒවා භාවිතා කරන පිරිස් අතින්. ප්‍රාදේශීය නිලධාරීන් හා ප්‍රාදේශීය ගොවි සංවිධාන මගින් මෙම වාරිමාර්ග පද්ධති කළමනාකරණ හා නඩත්තු කටයුතු සංවිධානය කෙරුනත් ඒවායේ පැවැත්ම රඳා පවතින්නේ පිරිස එකට එක්වී සක්‍රීයව එම කටයුතුවලට දායක වීම තුළින් පමණයි. එහෙත්, නිකරුනේ විනාශ මුඛයට යන බොහොමයක් වාරි නිර්මාණ එම සාමූහික වගකීම වර්තමාන ප්‍රජාව තුල කොතරම් දුරට මුල්බැස ඇත්දැයි නැවතත් සිතන්නට අප පොළඹවයි.

## සාමූහික වගකීමක්…

පිරිසක් එකට එක් වී සාමූහිකව යම් කටයුත්තකට දායක වීමට නම් ඔවුන්ට එම කටයුත්ත සාර්ථකව කිරීමේ හැකියාවක් තිබෙන බවට 'විශ්වාසයක්' තිබිය යුතු බව සමීක්ෂණ මගින්ද සනාථ කර ඇත. තවද මේ සඳහා එක් එක් පුද්ගලයන් තමන් කොතරම් දුරට වාරිමාර්ග පද්ධතීන් ගෙන් යැපෙන කණ්ඩායමේ පුද්ගලයකු ලෙස අනන්‍යතාවයක් ගොඩ නගා ගෙන ඇත්දැයි දරන මතයද බලපාන බවට සොයා ගෙන ඇත. වාරිමාර්ග සාමූහිකව නගා සිටුවීමට නම් මානව සම්පත තුල ඇති නැඹුරුව හා එයට බලපාන සාධක සොයා බැලීම කාලීන අවශ්‍යතාවක් වන්නේ ඒවා මානව සම්පත කාර්යක්ශමව මේ කෙරෙහි නැඹුරු කරවීමට යොදාගතහැකි නිසයි.

## මහකණුමුල්ල වැව හා මිනිසුන්…

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකණුමුල්ල වැව් එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව සිදු කරන ලද සමීක්ෂණයට අනුව සොයාගත් වැදගත් කරුණු කීපයකි. එනම්,

## මහකණුමුල්ල වැව් එල්ලංගා පද්ධතිය

ජීවත් වන පිරිස් තම ප්‍රදේශයේ පවතින වැව් ඇලවේලි නඩත්තු කටයුතු හොඳින් සිදු කිරීමට ගමක් ලෙස ඔවුන්ට හැකියාවක් ඇති බවට සැලකිය යුතු විශ්වාසයක් ඇත. මීට අමතරව එම පිරිස් අතර තමා එම ප්‍රදේශයේ පුද්ගලයකු ලෙස ඇති අනන්‍යතාවය පිළිබඳ දැක්මද ඉහළ මට්ටමක පවතින බව සොයා ගෙන ඇත.

එසේම පුද්ගලයෙක් තම ප්‍රදේශයේ වාරිමාර්ග සම්බන්ධ පොදු කටයුතු වලට සම්බන්ධ වී ක්‍රියා කළ හැකි යැයි විශ්වාස කිරීමට එම පුද්ගලයා තමන් එම ප්‍රදේශයට අයත් කෙනෙකු බවට දරන මතය ධනාත්මකව බලපා ඇත.

මෙවැනි වැව ආශ්‍රිත පොදු කටයුතු වලට සම්බන්ධ වීමේ හැකියාව ගැන ඇති එම විශ්වාසය එම පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂ භාවය, ප්‍රධාන රැකියාව, ගොඩ හා මඩ ඉඩම් පිළිබඳ ඇති අයිතිය හා ප්‍රමාණය මත වෙනස් විය හැකි බව තව දුරටත් හෙළි වී ඇත. එලෙසම අදාල ප්‍රදේශයේ පුද්ගලයෙකු ලෙස ඇති අනන්‍යතාවයට ද එම පුද්ගලයාගේ රැකියාව, ගොඩ හා මඩ ඉඩම් අයිතිය, ප්‍රමාණය හා එම පුද්ගලයාගේ වයස වැනි කරුණු ද බලපාන බව සනාථ වී තිබේ.

වාරිමාර්ග පද්ධති නඩත්තුව හා කළමනාකරණය සඳහා සක්‍රීය සහභාගිත්වය අවම මට්ටමක පවතින පසුබිමක ඉහත සමීක්ෂණයේ සොයාගැනීම් පොදු කළමනාකරණ යාන්ත්‍රණ නිර්මාණයේ දී භාවිතයට ගන්නේ නම් තවදුරටත් මිනිසුන් එම පොදු කටයුතු සඳහා සක්‍රීයව දායක කර ගත හැකි බවත්, පොදු කටයුතු වල යෙදීමේ හැකියාව පිළිබඳ ඇති ඉහළ විශ්වාසයත්, එම ප්‍රදේශයේ පුද්ගලයකු ලෙස තමන්ගේ අනන්‍යතාවය ගැන ඇති මතයත් යන අභ්‍යන්තරික කරුණු පිළිබඳ මනා අවබෝධය එම පොදු කටයුතු සාර්ථක වීමේ ඉඟියක් ලෙසත් සැලකිය හැක.

මෙම සමීක්ෂණයේ සොයාගැනීම් ප්‍රායෝගිකව යොදා ගැනීම තුළින් වත්මන් වාරිමාර්ග පද්ධතීන්ගේ තත්ත්වය මීට වඩා ඉහළ නැංවීම කෙරෙහි මානව සම්පත හැසිරවීමටත්, එමගින් වාරිමාර්ග කෘෂිකර්ම කටයුතුවල වැඩි දියුණුවක් ළඟා කර ගැනීමටත් හැකිවනු ඇත.

This is a non-technical summary of the project report titled “Impact of Perceived Social Identity on Collective Efficacy Beliefs: An Insight from the Mahakanumulla Tank Cascade System” supervised by Dr. J.M.P.N. Anuradha*, Department of Agricultural Extension, Faculty of Agriculture, University of Peradeniya.
anuradhaj@agri.pdn.ac.lk



# කෝමාරිකා වානිජ වගාවට අත්වැලක්

ප්‍රසංගි අලහකෝන්

'කෝමාරිකා' නම ඇසූ සැනින් ඔබ කවුරුත් දන්නා හදුනන බොහෝ නිවෙස් වල දක්නට ලැබෙන ඖෂධීය ශාකයක් බව නොරහසකි. එසේම මෑතක් වනතුරු කෝමාරිකා අප කාගේත් ගෙවත්තට සීමා වූ, එතරම් ප්‍රසිද්ධ ශාකයක් නොවුනත් වර්තමානය වන විට ඉතා සීඝ්‍රයෙන් වාණිජ වගාවන් සඳහා ඉහළ ඉල්ලුමක් ලැබෙමින් පවතින ශාකයක් වී ඇති බවද ඔබ දන්නවා ඇත. එයට සැබවින්ම හේතු වන්නේ කෝමාරිකා සතුව පවතින ඖෂධීය ගුණයෙන් යුතු ජෛව ක්‍රියාකාරී සංයෝග නිසාවෙන් ආයුර්වේද ඖෂධ, රූපලාවන්‍ය නිෂ්පාදන හා ආහාර පාන වර්ග නිෂ්පාදනයට දේශීයව මෙන්ම විදේශීයව ඇති ඉහළ ඉල්ලුමයි.

නමුත් කෝමාරිකා වල විවිධ ප්‍රභේද තිබිය හැකි බවත්, ඒවායේ සංඝටක වල වෙනස්කම් තිබිය හැකි බවත් ඔබ මොහොතකට හෝ සිතා තිබෙනවා ද? එසේත් නැත්නම් ඔබ එවන් වෙනස්කම් නිරීක්ෂණය කර තිබෙනවා ද? බොහෝවිට ඔබේ පිළිතුර වනු ඇත්තේ නැත යන්නයි.ඒ අනුව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන කෝමාරිකා විශේෂ හෝ ප්‍රභේද හඳුනා ගැනීමටත් ඒවායේ රූපීය ලක්ෂණ වල විවිධත්වය සොයා බැලීමටත් මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ මේ පිළිබඳව ශ්‍රී ලංකාව තුළ තවමත් කිසිදු වාර්තාගත අධ්‍යයනයක් සිදු නොකල පසුබිමක් තුළය.මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයන්ට අනුව ශ්‍රී ලංකාවේ කෝමාරිකා විශේෂ අඩුම වශයෙන් 3ක් පවතින බවත් එකම විශේෂය තුළ වුවද ප්‍රභේද කීපයක් පැවතිය හැකි බවත් සොයා ගත හැකිවිය.

එසේම රූපීය ලක්ෂණ වල අපූර්ව විවිධත්වයක් කෝමාරිකා ශාකය සතුව පවතින බවද නිරීක්ෂණය කළ හැකි විය.

ඔබ වාණිජ කෝමාරිකා වගාවේ නියැලෙන පුද්ගලයෙක් නම් මෙම අධ්‍යයනයේ අවසන් නිගමන බොහෝ සෙයින් උපකාරී වනු ඇත. ඒ අනුව ඉහළ ඵලදාවක් ලබා දීමට වැඩි හැකියාවක් පවතින පැළ හඳුනා ගැනීමට පහත සඳහන් ලක්ෂණ ඉවහල් වනු ඇත.



විවිධ පත හැඩ හා පත අගස්ථ



කටු වල පිහිටීම



සුදු පැහැ ලප වල දාරයන්හි විවිධත්වය.පැහැදිලි (1), බොඳ (2)



පත්‍ර අග කටු පිහිටීම




කටු වල පැහැය .සුදු(1), සුදු හා දුඹුරු අග්‍ර (2), කහ (3)



**ලප පිහිටීමේ විවිධත්වය**

කහ පැහැයට හුරු කොල පැහැ පත්‍ර, රවුම් පත්‍ර අග්‍ර, පත්‍ර දාරයට ලම්භකව පිහිටි සුදු පැහැ කටු, පත් අග කටුවල විශේෂ පිහිටීම.



ජෛව විවිධත්වය අතින් ඉහළ ස්ථානයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ විවිධ කෝමාරිකා විශේෂ හා ප්‍රභේද පැවතිය හැකි බවත් ඒවා සතුව අපූර්ව රූපීය විවිධත්වයක් ඇති බවත් මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වන අතර ඒවා සංරක්ෂණයට හා ඒවායේ ඖෂධීය ගුණයන් සොයා ගනු වස් මෙය නිසැකවම උපකාරී වනු ඇත.තවද ඉහළ ඵලදාවක් ළඟා කරන සාර්ථක වානිජ කෝමාරිකා වගාවක හිමිකරුවෙකු වීමේ සිහිනයට අත්වැලක් වීමට මෙම අධ්‍යයනය නව මංපෙත් විවර කරනු නොඅනුමානය.

ජෛව විවිධත්වය අතින් ඉහළ ස්ථානයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ විවිධ කෝමාරිකා විශේෂ හා ප්‍රභේද පැවතිය හැකි බවත් ඒවා සතුව අපූර්ව රූපීය විවිධත්වයක් ඇති බවත් මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වන අතර ඒවා සංරක්ෂණයට හා ඒවායේ ඖෂධීය ගුණයන් සොයා ගනු වස් මෙය නිසැකවම උපකාරී වනු ඇත.තවද ඉහළ ඵලදාවක් ළඟා කරන සාර්ථක වානිජ කෝමාරිකා වගාවක හිමිකරුවෙකු වීමේ සිහිනයට අත්වැලක් වීමට මෙම අධ්‍යයනය නව මංපෙත් විවර කරනු නොඅනුමානය.

This is a non-technical summary of the project report titled "Morphological and Molecular Characterization of Selected Aloe Germplasm in Sri Lanka" supervised by Dr. N.U. Jayawardana*, Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya. nuj@pdn.ac.lk



# කුරුඳු වල පොත්ත රළු වීමේ රෝගය හදන්නේ කව්ද ???

**හෂිනි ආනන්ද**

කුරුඳු යනු ශ්‍රී ලංකාවට ආවේණික භෝගයක් වන අතර මේ වන විට ගාල්ල, මාතර, හම්බන්තොට මෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ද ව්‍යාප්තව ඇත. ලෝක වෙළඳ පොළේ සත්‍ය කුරුඳු ඉල්ලුමෙන් වැඩි ප්‍රතිශතයක් සපයනු ලබන රට වන්නේ ද ශ්‍රී ලංකාවයි.

නමුත් වෙනත් භෝග වලට මෙන්ම කුරුඳු වලට ද රෝග හා පළිබෝධ උවදුරු බොහොමයක් පවතී. ඒ අතරින් මෙම පොත්ත රළු වීමේ රෝගය ප්‍රධානතම තර්ජනය ලෙස සැලකේ. රෝගය ආරම්භ වන්නේ අර්ධ මෘදු කඳන් වල හට ගන්නා ඉතා කුඩා කළු පැහැති ලප විශේෂයක් මගිනි. කාලයත් සමගම කුඩා ලප ක්‍රමයෙන් විශාල වෙමින් කඳන් පුරා ව්‍යාප්ත වීම සිදුවේ. රෝගය දරුණු වූ විට පත්‍ර නාරටි අතර ප්‍රදේශය කහ පැහැ වී අවසන් වශයෙන් රෝගී කඳන් මිය යාම සිදුවේ.

පොත්ත රළු වීමේ රෝගය කුරුඳු අස්වැන්න අඩු වීමට විශාල වශයෙන් බලපා ඇත. මෙහිදී රෝගී කඳන් වල පොත්ත ඉවත් කිරීම ඉතාමත් අසීරු වේ. මේ නිසා රෝග පාලනයට යොමු වීම ඉතා වැදගත් වන අතර ඒ සඳහා රෝග කාරක ජීවියා හඳුනා ගත යුතුය.

පොත්ත රළු වීමේ රෝගය දිලීර ආසාධනයක් බව දැනට කරන ලද පර්යේෂණ වලින් හෙළිවී ඇත. නව තාක්ෂණික දියුණුවත් සමගම රෝග කාරක ජීවීන් හඳුනා ගැනීම සඳහා වඩාත්ම සුදුසු වන්නේ අණුක ජීව විද්‍යාත්මක ක්‍රම භාවිතය යි. මෙම අධ්‍යනයේදී රෝගී කඳන් මගින් ලබා ගත් දිලීර මෙන්ම නිරෝගී කඳන් මගින් ලබා ගත් දිලීර අණුක ජීව විද්‍යාත්මකව හඳුනා ගන්නා ලදී. Neopestalotiopsis clavispora" Pestalotiopsis sp'" Pestalotiopsis microspora" Colletotrichum fructicola සහ Fusarium oxysporum යන දිලීර විශේෂ රෝගී මෙන්ම නිරෝගී කඳන් වල ඇති බවට මෙහිදී තහවුරු විය. අධ්‍යනයට අනුව මෙම දිලීර විශේෂ නිරෝගී කුරුඳු කඳන් වල රෝගී කාරක නොවී නිධන්ගතව පැවත පසුව රෝගී කාරක වනු ඇතැයි අනුමාන කළ හැකිය.

එමෙන්ම Phanerochaete sp. සහ Colletotrichum gloeosporioides යන විශේෂ රෝගී කඳන් වලින් පමණක් වාර්තා විය. මෙහි සඳහන් Phanerochaete sp. නම් දිලීර විශේෂයට ලිග්නින් හා සෙලියුලෝස් සංයෝග ජීර්ණය කරමින් සණ පෘෂ්ඨ නිර්මාණය කිරීමේ සුවිශේෂී හැකියාවක් පවතී. එම නිසා රෝගයේ රළු ස්වභාවයට මෙම දිලීර විශේෂය හේතු වනවා විය හැකිය. එසේම මෙය රෝගයේ ද්විතීයික ආක්‍රමණිකයෙකු ද විය හැක. කෙසේ වෙතත් Colletotrichum gloeosporioides නම් දිලීර විශේෂයේ රෝගී කාරක ස්වභාවය එතරම් පැහැදිලි නැත.

අවසන් වශයෙන්, මෙම අධ්‍යනය මගින් සොයා ගත් කරුණු සාර්ථක මෙන්ම කාර්යක්ෂම රෝග පාලන ක්‍රමයක් ගොඩ නගා ගැනීම සඳහා ඉවහල් වනු ඇතැයි ද එමගින් දේශීය කුරුඳු නිෂ්පාදනය තව දුරටත් ශක්තිමත් වෙමින් දේශීය කුරුඳු ගොවියාගේ අත මිට සරු වනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු.



This is a non-technical summary of the project report titled “Molecular Identification of Fungi Associated with Rough Bark Disease Infected Cinnamon Plants in Comparison to Healthy Plants” supervised by Prof. D.M. De Costa*, Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya.
devikadecosta@gmail.com



# ගොයම් ගසට ඇති තරගය... අවසන කුමක් සිදු වේවිද?

සලනි ප්‍රනාන්දු

වෙළඳපොළින් එළවළු, පලතුරු මිලදී ගැනීමේදී ඒවායේ නැවුම් බව හා වස විෂ වලින් තොර භාවය පිළිබඳ ඔබ කොතරම් දුරට සැලකිලිමත් වනවා ද? නමුත් ඔබගේ ප්‍රධාන ආහාරය වන සහල් මිලදී ගැනීමේදී ඔබ කෙතරම් සුරක්ශිත යැයි සිතනවා ද?

බැර ලෝහයක් වන කැඩ්මියම් වරක් ශරීරගත වූ පසු අවුරුදු 10 ත් 30 ත් අතර කාලයක් ශරීරය තුල රැඳී සිටීමට හැකියාවක් ඇත. දීර්ඝ කාලීනව කැඩ්මියම් වලට නිරාවරණය, වකුගඩු, පෙනහලි හා අස්ථි ආශ්‍රිත රෝග ගණනාවකට අතවැනීමකි.

**ඔබ දන්නවා ද?** ගොයම් ගසට පසෙහි පවතින කැඩ්මියම් අවශෝෂණය කර, මුල, කද, කරල යනාදී ශාකයේ කොටස්වල එය එක් රැස් කරගැනීමට විශේෂ හැකියාවක් ඇති බව... එම එක් රැස් වු කැඩ්මියම්හි අවසානය කුමක් වේද? අපගේ සිරුර එක් නැවතුම්පලක් නොවේද?

සින්ක් නැතහොත් තුත්තනාගම් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගාකෙරෙන ප්‍රදේශයන්හි පසෙහි පවතින ඌන පෝෂකයකි. එම නිසා කෘෂිකර්ම දෙපර්තුමෙන්තුවේ නිර්දේශය වන්නේ හෙක්ටෙයාරයකට කිලෝ 5 ක් වන පරිදි පසට සින්ක් සල්ෆෙට් පොහොර යෙදීමයි. මෙම සින්ක් පසෙහි ඇති කැඩ්මියම් සමග ගොයම් ගසට අවශෝෂණය සඳහා තරගයක යෙදෙයි.

ඒ අතරින් පසෙහි අනෙකාට වඩා වැඩියෙන් පවතින මූලද්‍රව්‍ය තරගයේ ජය ලබා ශාකය තුලට වැඩියෙන් අවශෝෂණය වේ.

වර්තමානයේ, ජීව අගුරු පසට යෙදීම ගොවීන්හට වාසි රැසක් අත්වන හා පාරිසරික හිතාකාමී යෙදුමක් ලෙස ප්‍රචලිතව ඇත. අගුරු වලට සමාන ද්‍රව්‍යක් වන මෙය කෘෂිකාර්මික අපද්‍රව්‍යය වැනි දෑ භාවිතයෙන්, පාලිත තත්ව යටතේ නිපදවූ ද්‍රව්‍යකි. මෙම ජීව අගුරුවලට පසෙහි පවතින කැඩ්මියම් වැනි ලෝහ රඳවා ගෙන ඒවා ශාක වලට අවශෝෂ්ණය වීම අඩු කිරීමට හැකි බව විද්‍යාත්මක මතයයි. නමුත් කැඩ්මියම් පමණක්ම නොව සින්ක් ද මෙමගින් රඳවා ගත හැක.



එබැවින්, පසට ජීව අගුරු යෙදූ පසු පසෙහි සින්ක් හා කැඩ්මියම් අතර ගොයම් ගසට අවශෝෂණය සඳහා තිබූ තරගයට කුමක් සිදු වේවිද? ගොයම් ගසෙහි කැඩ්මියම් වැඩිවේවිද? අඩුවේවිද?

මෙය පරීක්ෂා කිරීම සඳහා ගොයම් ශාක බඳුන්ගතව වගා කරන ලදී. එහිදී, කුරුණෑගල ප්‍රදේශයේ කුඹුරු 9 කින් ලබා ගත් පස් සාම්පලයන්හි කැඩ්මියම් ප්‍රමාණය පරීක්ෂා කරන ලදී. සෑම පසක්ම, ආහාර දාමය හරහා මිනිස් සිරුරට අතුලු වී හානි පැමිණවිය නොහැකි මට්ටමේ ඉතා ම අඩු කැඩ්මියම් ප්‍රමාණයන්ගෙන් සමන්විත විය. ඒ අතුරින් එක් කුඹුරකින් ලබාගත් කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 0.25 ක කැඩ්මියම් සාන්ද්‍රණයක් සහිත වූ පසක වී වගා කරන ලදී. මීට අමතරව පසෙහි තරමක් වැඩි කැඩ්මියම් සාන්ද්‍රණයකදී මෙය පරීක්ෂා කිරීම සඳහා කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 3 ක් ලෙස කැඩ්මියම් එක් කළ තවත් බඳුන් සකස් කෙරිණි. එහිදී දහයියා ජීව අගුරු 0.1 % අනුපාතයෙන්ද, සින්ක් සල්ෆෙට් පොහොර නිර්දේශය පරිදි ද යොදන ලදී.

ප්‍රතිඵල අනුව කැඩ්මියම් අඩු සාන්ද්‍රණයක් සහිත පසට සින්ක් පොහොර යෙදීම මගින් පසෙහි සිට මුලට පරිසංක්‍රමණය වූ කැඩ්මියම් ප්‍රමාණය වැඩි විය. නමුත් එම මුලෙහි කැඩ්මියම් වැඩිවීම හානිදායක මට්ටමේ වැඩිවීමක් නොවුනා සේම, එමගින් සහල් වල කැඩ්මියම් වැඩි නොකරන බවත් නොඅනුමනය. කෙසේවෙතත් කැඩ්මියම් තරමක් වැඩි සාන්ද්‍රණයක් සහිත පසට වුවද, සින්ක් පොහොර යෙදීම නිසා ශාකයේ කැඩ්මියම් අවශෝෂණයේ වැඩිවීමක් දක්නට නොලැබිණි.ඉදින් තවත් දෙගිඩියාවෙන් සිටිය යුතු නැත. ශාකවලට මෙන්ම මිනිසාටත් අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂකයක් ලෙස, පස සින්ක් ඌණතාවයෙන් තොර කිරීම ඔබගේ සෞඛ්‍යයට සේම ආර්ථිකයටද වැදගත් වේ. තවද, ඉහත කී කැඩ්මියම් සාන්ද්‍රණ එකකදීවත් දහයියා ජීව අගුරු යෙදීම මගින් පසෙහි සිට මුලට පරිසංක්‍රමණය වන කැඩ්මියම්හි වෙනසක් සිදු නොවීය. එහි වැඩිවීමක් සිදු වූවේද නැත.

ඔබට දැන් වැටහෙන්නට ඇත. තරගය කෙසේ වූවත් අවසන, අප පරාජය වී නොමැත. සින්ක් පොහොර හා ජීව අගුරු පසට යෙදීම, අපගේ බත් පතෙහි කැඩ්මියම් වැඩි කර නැත.

එබැවින්, ප්‍රයෝජන රැසක් සහිත මේ සින්ක් පොහොර හා ජීව අගුරු පසට යෙදීමට ද ඔබ කිසි සේත් සිතෙහි කුහුලක් හෝ බියක් තබා ගත යුතු නැත.

This is a non-technical summary of the project report titled “Cadmium Phytoavailability for Rice as Affected by Soil Application of Biochar and Zinc Sulphate” supervised by Dr. A.M.C.P.K. Attanayake*, Department of Soil Science, Faculty of Agriculture, University of Peradeniya.
chammiattanayake@gmail.com



# කිරි ගොවීන්ට වාසි ගෙනදිය හැකි දෙමුහුම් බඩ ඉරිඟු හා සෝර්ගම් ප්‍රභේද හඳුනා ගනිමු

**දීලක ජාගොඩ**

ලංකාවේ වාණිජ වශයෙන් සිදු කෙරෙන කිරි ගව පාලනය වසර 70 ක පමණ අතීතයකට උරුමකම් කීවද අප තවම දේශීයව නිපදවනු ලබන්නේ කිරි ඉල්ලුමින් 38% පමණ ප්‍රමාණයකි. එනිසා වසරකට ඩොලර් මිලියන 293.5 ක් පමණ මුදලක් වැය කරමින් කිරි නිශ්පාදන 93.7 MT පමණ ප්‍රමානයක් ආනයනය කිරීමට සිදුව ඇත. දියුණු වෙමින් පවතින රටක් ලෙස මෙවන් වියදමක් දිගින් දිගටම දැරීම අපහසුය. එනිසා කිරි නිෂ්පාදනය ඉහල නැංවීම යුගයේ අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබූ විවිධ පර්යේෂණ වලට අනුව කිරි දෙනුන්ගේ නිෂ්පාදකතාව අඩු වීමට ප්‍රධානතම හේතුව පෝෂණ ඌනතාවයන් බව තහවුරු වී ඇත. එම නිසා ඉහල අස්වැන්නක් ලබාදෙන ගුණාත්මයෙන් ඉහල තෘණ ප්‍රභේද හදුනාගැනීම ඉතා වැදගත්ය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය, ගන්නෝරුවේ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය හා මහඉලුප්පල්ලමේ ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය එකතුව ගව ආහාර සදහා සුදුසු තෘණ ප්‍රභේද සොයා ගැනීමේ අරමුණින් වියලි කලාපයේ මහ කන්නයේදී සිදු කරනු ලැබූ මෙම පර්යේෂණය මගින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලගා කර ගැනීමට හැකි විය.

අපගේ පර්යේෂණය සදහා දේශීයව හා විදේශීයව අභිජනනය කරන ලද දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේද (Badhra, MI Hybrid 1, MI hybrid 2, Pacific 339" Jet 999) හා සෝර්ගම් ප්‍රභේද (Sugargraze" MI Sweet Sorghum) ගන්නා ලදි. එම ප්‍රභේද වැඩි හා අඩු ශාක ඝණත්වයන් යටතේ මහඉලුප්පල්ලම, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන භූමියේ වගා කර එහි, අස්වැන්න, සංයුතිය සහ පෝෂණ ගුණය නිර්ණය කෙරිනි.

ආනයනය කරනු ලබන දෙමුහුම් Pacific 339 බඩඉරිඟු ප්‍රභේදයෙන්, හෙක්ටයාරයකට 13.7 MT ක අස්වැන්නක් ලබා ගත හැකි විය. එහි ඉහල ප්‍රෝටීන ප්‍රමාණය (10.36%) හා ඉහල ශක්ති ප්‍රමාණයක් (10.11 MJ/kg) අඩංගු වන අතර ජීරනකතාවයද ඉහලය (63.87%). මේ හේතුවෙන් වැඩි කිරි නිෂ්පාදනයක් සහිත එල දෙනුන් සඳහා Pacific 339 ප්‍රභේදය වගාකිරම යෝග්‍ය වේ. තවද දේශීයව අභිජනනය කල දෙමුහුම් MI Sweet Sorghum ප්‍රභේදයෙන්, වියලි කලාපයේ මහ කන්නයේදී හෙක්ටයාරයකට 66.8 MT ක අස්වැන්නක් ලබා ගත හැකි විය. එම ප්‍රභේදයේ ප්‍රෝටීන ප්‍රමාණය 5.24% ක්ද ශක්ති ප්‍රමාණය 5.47 MJ/kg ක්ද, ජීරනකතාව 37.07% ක් බවද සොයා ගන්නා ලදි. කෙසේ වෙතත් ඉතා ඉහල අස්වැන්න නිසා MI Sweet Sorghum ප්‍රභේදය මධ්‍යස්ථ කිරි නිෂ්පාදනයක් ලබා දෙන කිරි ගවයන් සඳහා වගාකිරිම යෝග්‍යය වන බව නිර්දේශ කල හැක.

අපගේ පරීක්ෂණය මගින් හුදෙක් ස්භාවිකව වැවෙන තෘණ වර්ග කිරි ගවයන් හට ආහාරයට ලබා දීම වෙනුවට ඉහල පෝෂණ අගයෙන් යුත් Pacific 339 හා MI Sweet Sorghum ප්‍රභේද වගා කර ගවයන්ට ආහාරයට ලබා දීමෙන් වැඩි කිරි අස්වැන්නක් ලබා ගැනීමට හැකි බව සනාත වී ඇත. ඉහල අස්වැන්නක් හා පෝෂණීය අගයක් සහිත මෙම තෘණ ප්‍රභේද ශ්‍රී ලංකාවේ පරිහානියට ලක් වන කිරි ගව කර්මාන්තයට නැවත ජීවය ලබා දෙන තීරණාත්මක සාධකයක් වන බව නොඅනුමානය.



This is a non-technical summary of the project report titled “Potential of Selected Maize and Sorghum Varieties Cultivated During *Maha* Season in the Dry Zone for Dairy Cattle Feeding” supervised by Mr. M.B.P. Kumara Mahipala*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya.
pmahi@pdn.ac.lk



# සැල්වීනියා පොස්පරස් පොහොරක්...?

**හසිනි නිලූමා**

ඔබ දන්නවාද සැල්වීනියා කියන්නේ ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් පැතිරී පවතින තර්ජනාත්මක ආක්‍රමණශීලී පැලෑටියක් බව. දින 03ක් වැනි කෙටි කාලයකින් එහි වියලි බර සීග්‍රයෙන් දෙගුණ වන අතර ජලාශ පුරා ඝණ වැස්මක් ඇති කිරීමට සමත් වේ.

වර්ථමානයේ අප ජලය පවිත්‍ර කිරීම සඳහා ශාක විශේෂ යොදා ගැනීම දිනෙන් දින දියුණු වන ක්ෂේත්‍රයකි. සැල්වීනියා සතු පෝෂක උරා ගැනීමේ හා ගබඩා කිරීමේ හැකියාව, ගව පාලනයේදී ඉවත ලන අපජලයේ පෝෂක විශේෂයෙන් පොස්පරස් පිරිපහදු කිරීමට ප්‍රයෝජනයට ගෙන මෙම සොයාගැනීම සිදුකර ඇත.

මෙම පෝෂක අවශෝෂිත සැල්වීනියා, පොස්පරස් පොහොරක් ලෙස භාවිතා කිරීමට හැකිබව ඔබ දැන සිටියාද? සැල්වීනියා වියලි බරින් 1.26%ක් පොස්පරස් ගබඩා කර ගත හැකි බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගනු ලැබුවා.

ශාක වර්ධනයට පොස්පරස් අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍යක් වන අතර පසෙහි ලබා ගත හැකි පොස්පරස් ප්‍රමාණය අඩු වීම ශාක වර්ධනයට සෘජුවම බලපානු ලැබේ. එමෙන්ම, විවිධ ප්‍රභවයන්ගෙන් ජලාශ වලට එක්වෙන පොස්පරස් අඩංගු පෝශක හේතුවෙන් ජලාශ සුපෝෂණය, නයිට්‍රජන් හා පොස්පරස් පෝෂක සාන්ද්‍රණය වැඩිවීමෙන් ජලාශ වල ඇල්ගී වර්ධනය වීමෙන් ජලයේ ගුණාත්මක භාවය අඩු වීමය වීමද තවත් තර්ජනයකි.

ගව පාලනයේදී පිටකරන අපජලයේ පොස්පරස්, සැල්වීනියා වලට උරාගැනීමට සලස්වා ශාකය පොස්පරස් වලින් සන්තෘප්ත අවස්ථාවේදී ජලයෙන් ඉවතට ගෙන 70°C උෂ්ණත්වයේ වියලා කුඩු කර



පොහොරක් සැකසීමට හැකි බව මේ වන විට සොයාගෙන අවසන්. වී වගාවේදී ගොවීන් යොදාගන්නා TSP පොස්පරස් පොහොර වෙනුවට මෙම සාදාගත් කාබනික පොහොර යොදා ගනිමින් කල අධ්‍යයනයේදී සැල්වීනියා පොස්පරස් පොහොරක් ලෙස ඉතාමත් කාර්‍යක්ෂමව ක්‍රියා කරමින් ශාකයේ අස්වැන්න හා වර්ධනය වැඩි කරන බව සොයාගෙන ඇත.



මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගත් කරුණු පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනයටත්, ආක්‍රමණශීලී සැල්වීනියා පාලනයටත් නව මංපෙත් විවර කරනු ඇත.

This is a non-technical summary of the project report titled “Recovering the Phosphate from Animal Farm Effluents through Phytoremediation: A Possible Source of Bio-Phosphorus Fertilizer” supervised by Dr. M. Ariyaratne, Department of Crop Science, Faculty of Agriculture, University of Peradeniya.
mariyaratne@yahoo.com



# අප්‍රිකානු රැජින "ගිරා හොට කුඩළු" ලංකාවේ මල් වගා ක්ෂේත්‍රයටත්

**සසිනි රසාංගා**

අප්‍රිකාවේ නිවර්තන වැසි වනාන්තර නිජබිම කොටගෙන හටගෙන ඇති ගිරා හොට කුඩළු ශාකය, ලංකාවේ දේශගුණ තත්ත්ව යටතේද ඉතා හොඳින් වගා කළ හැක. ඉතා අලංකාර දීප්තිමත් රතු සහ කහ පැහැති මෙම ශාකයේ මල් ගිරා හොටක හැඩය ගනී.

ලංකාවේ තෙත් සහ අතරමැදි කලාප වලට වඩාත් සුදුසු වන මෙම ශාකය, මනා ජල කළමනාකරණයකින් යුතුව වියළි කලාපයේද පහසුවෙන් වගා කළ හැක. ගිරා හොට කුඩළු ශාකයේ විද්‍යාත්මක නාමය ඉම්පේෂන්ස් නියම්නියාමෙන්සිස් (Impatiens niamniamensis) වේ. මෙම කුඩළු විශේෂය ශාක ලෝකයේ අපූර්ව වර්ණ සංකලනය මනාව විදහාපායි.

සාමාන්‍යයෙන් අතු නොබෙදී අඩි 2-3ක් පමණ උසට වර්ධනය වන නිසා මෙම ශාකය බඳුන් ගත වගාවට යොදා ගැනීමේදී ගැටළු මතුවේ. එමනිසා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයට අයත් බෝග විද්‍යා දෙපාර්තමේන්තුව මගින් උසින් අඩු, හොඳින් අතු බෙදුණු හා මල් පිරුණු අලංකාර ශාකයක් සාදා ගැනීම සඳහා නව සොයාගැනීම් සිදුකර ඇත. එය මල් වගා ක්ෂේත්‍රයට ඉතා වැදගත් ආරංචියක් වනු ඇත.

මෙම පරීක්ෂණයට උද්‍යාන බෝග වගාවේදී බහුලව භාවිතා වන වර්ධන නිශේධකයක් වන පැක්ලබියුට්‍රසෝල් (Paclobutrazol) නම් රසායන ද්‍රව්‍යය ගිරා හොට කුඩළු ශාකයේ උස අඩු කිරීම, අතු බෙදීම උත්තේජනය හා මල් ප්‍රමාණය වැඩි කිරීම යොදා ගත හැකි බව සොයාගෙන ඇත. ඉතා සුළු ප්‍රමාණ වලින් අවශ්‍ය වීම, දිගුකාලීන ප්‍රතිඵල සහිත වීම, පහසු මිලට කෘෂි වෙළඳසැල් වලින් ලබාගත හැකිවීම හා පරිසරයට අහිතකර නොවන සංයෝගයක් වීම මෙම රසායනික සංයෝගයේ විශේෂ ලක්ෂණ වේ.

ඔබේ අවශ්‍යතාවයට අනුව මෙම කුඩළු ශාකය අලංකාර බඳුන්ගත විසිතුරු ශාකයක් ලෙස සකසා ගැනීමට, පළමුව මව් ශාකයෙන් පුරුක් 3-4ක් පමණ සහිත හොඳින් වැඩුණු අතු කැබලි ගෙන, ඒවා වැලි හා කොම්පෝස්ට් 1:1 අනුපාතයෙන් මිශ්‍රකර සාදාගත් වගා මාධ්‍යක සිටවනු ලබයි. ඉක්මනින් මුල් ඇදීම සිදුවන නිසා මෙම ශාකය බෝ කර ගැනීම ඉතා පහසුය. බඳුනේ සිටවා සති 6කට පමණ පසුව ලීටරයට මිලිග්‍රෑම් 5 ක සාන්ද්‍රණයකින් යුතු පැක්ලබියුට්‍රසෝල් ද්‍රාවණයෙන් මිලිලීටර 25 ක් ශාකයේ බඳුන් මාධ්‍යට යොදනු ලබයි. එසේම අඛණ්ඩව ජලය හා පොහොර නියමිත ප්‍රමාණ වලින් යෙදීම අවශ්‍ය වේ. පොහොර ලෙස ඇල්බට් පොහොර මිශ්‍රණයෙන් ග්‍රෑම් 2.5 ක් ජලය ලීටර 2 ක දියකර යෙදීම සිදුකළ හැක.

පැක්ලබියුට්‍රසෝල් ද්‍රාවණය ශාකයේ පත්‍ර මතට යෙදීමට වඩා බඳුන් මාධ්‍යට යෙදීම මගින් වඩා සාර්ථක, දීර්ඝ කාලීන ප්‍රතිඵල ලැබෙන බවද, වැඩි සාන්ද්‍රණයකින් යෙදීම ශාකයේ විකෘති ස්වභාවයක් ඇති කිරීමට හේතු වන බවද මෙම පර්යේෂණයේදී තවදුරටත් සොයාගන්නා ලදී.

මෙසේ අලංකාර බඳුන්ගත විසිතුරු ශාකයක් ලෙස නිර්මාණය කරගත් ගිරා හොට කුඩළු ශාකය ඔබේ ගෙවත්තට, ඔබේ නිවසට නැවුම් ආලෝකයක් එක් කරනු ඇති අතර මල් වගා කර්මාන්තයටද මෙය ඉතා හොඳ ආදායම් මාර්ගයක් වනු ඇත



This is a non-technical summary of the project report titled "Effect of Paclobutrazol on Growth and Flowering of Parrot Impatiens (*Impatiens niamniamensis*)" supervised by Prof. J.P. Eeswara*, Department of Crop Science, Faculty of Agriculture, University of Peradeniya. jpe@pdn.ac.lk



# ආක්‍රමණික වල් සුදුළුණු ශාකය රෝමාන්තිකයන්ගේ ආහාරයට සුදුසු වේ

**සහන් ජයරත්න**



අපේ රටේ රෝමාන්තිකයන්ගෙ ආහාර සඳහා වැඩි වශයෙන් භාවිතා කරනුයේ ස්වභාවික තෘණ වර්ග වේ. ගිනි තණකොළ ඒ අතර ප්‍රධාන තැනක් උසුලයි. එනමුත් ගිනි තණකොළ උසස් පෝෂණ ගුණයෙන් යුක්ත නොවේ. එබැවින් ප්‍රෝටීන හා ශක්ති අවශ්‍යතාවය සපුරා දීම සඳහා ගුණාත්මයෙන් ඉහල, ලාභදායි වෙනත් තෘණ වර්. සෙවීමට කාලය එළඹ තිබේ.

වල් සුදුළුණු (Petiveria allacea) යනු මිනිසුන්ට කරදරයක්ව පවතින, ඉතා වේගයෙන් ව්‍යාප්ත වන, ඇමරිකානු සම්භවයක් සහිත ආක්‍රමණික ශාකයකි. විවිධ රටවල මෙම ශාකයේ කොටස් ශාකසාර බෙහෙත් ලෙසද භාවිත කරයි. මේ වනවිට ලංකාව ආක්‍රමණය කර ඇති වල් සුදුළුණු මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වල ගොවිබිම් පුරා වේගයෙන් ව්‍යාප්තවී තිබේ. එනිසා මෙම වල් සුදුළුනු රෝමාන්තිකයන්ගෙ ආහාරයට එකතු කල හැකිද යන්න අධ්‍යනයක්. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සත්ව පාලන දෙපාර්තමේන්තුවේ සහ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.

මෙහිදී ප්‍රථමයෙන් මෙම වල් පැලැටියෙහි පෝෂක සංයුතිය හදුනාගැනීම සිදු කරන ලදී. තවද එහි ටැනින් නැමැති ජීර්ණකතාවය සහ පරිවෘතීය ශක්තියට බලපාන ප්‍රතිපෝශකය අන්තර්ගතය සහ, ජීර්ණ හැකියාව රසායනික ලෙස නිර්ණය ලදී. එහි ප්‍රතිඵල ලෙස වල් සුදුළුනු ශාකයේ 15% ක ගුණාත්මයෙන් ඉහළ ප්‍රෝටීන ප්‍රමාණයක් සහ ඉහළ පරිවෘ;ය ශක්ති ප්‍රමාණයක් (7.71 MJ/kg) ඇති බවත්, එය ගිනි තණකොළ වලට සාපේක්ෂව ඉහල අගයක් ගන්නා බව සොයා ගැනිණි. කෙසේ වෙතත් ටැනින් නැමැති ප්‍රතිපෝශකය සුළු වශයෙන් අඩංගු බැවින් ජීර්ණකතාවය සහ පරිවෘතීය ශක්තිය අඩු විය හැකි බවද, එබැවින් සම්පූර්ණ වශයෙන් මෙම ශාකය සතුන්ගේ ආහාරය සඳහා භාවිත කිරීම නුසුදුසු විය හැකි බව උපකල්පනය කරන ලදී. .

ඒ අනුව මෙම ශාකයෙහි කොපමණ ප්‍රමාණයක් ආහාරය සඳහා සුදුසුද යන්න සෙවීම සඳහා මෙම ශාකය 35% ඇතිව සහ නැතිව පූර්ණ මිශ්‍ර සලාක දෙකක් සාදන ලදී. පසුව සතුන් යොදා ගනිමින් සතුන් තුල එහි ජීර්ණ හැකියාව සංසන්දනය කරන ලදී. එහි ප්‍රතිඵල ලෙස මෙම ශාකයෙහි 35% ක් ආහාරයට එක් කිරීම ජීර්ණය සඳහා බලපෑමක් නොමැති බව තහවුරු වුනි. නමුත් පරීක්ෂණාගාරය තුල සිදු කල පරීක්ෂණයෙන් ලැබුණු ජීර්ණ හැකියාවට වඩා සානන් එළුවන් යොදාගෙන කල පරීක්ෂණයේ ජීර්ණ හැකියාව ඉහල අගයක් ගත්තේය. එබැවින් 35% ක් එක් කල පූර්ණ මිශ්‍ර සලාක රෝමාන්තික සතුන්ගේ ආහාරය සඳහා භාවිතා කල හැකි බව සහ එහිදී සංයුක්ත ආමාශය තුළ සිදුවන ජීර්ණයට අමතරව ආහාර මාර්ගය තුළ එන්සයිම මගින් සිදුවන ජීරණය එළුවන් තුල සැලකිය යුතු කරුණක් බවත් නිගමනය කරන ලදී. එසේම එසේ භාවිත කිරීම ආර්ථිකමය වශයෙන් ලාභදායි බවද තහවුරු විය.

This is a non-technical summary of the project report titled "Assessment of Forage Value of Invasive Petiveria alliacea for Ruminant Feeding" supervised by Mr. M.B.P. Kumara Mahipala*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya.
pmahi@pdn.ac.lk

# උද්‍යාන අලංකරණයේ දිගුකාලීන සුන්දරත්වය රැක ගන්නට ශාක පරිසරයේ නිසි ලෙස ස්ථානගත කරමු



**විරශ්මි කොඩිතුවක්කුගේ**

උද්‍යාන හා භූමි අලංකරණ ක්ෂේත්‍රය ලංකාවේ ජනප්‍රිය ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැක. එසේ නිමවූ උද්‍යානයක අලංකාර බව කාලයත් සමග වියැකී යන්නට, ප්‍රධානතම හේතුවක් ලෙස උද්‍යාන අලංකරණයට යොදා ගන්නා ශාක නිසි පරිසරයේ ස්ථානගත නොකිරීම දැක්විය හැක.

ශාකයක පැවැත්ම, එහි වර්ධනය හා ගුණාත්මක පෙනුමට ආලෝකය යන පරිසර සාධකය ඉතා වැදගත් වේ. ලංකාව වසර පුරා එකම තීව්‍රතාවකින් සූර්‍යාලෝකය ලබන රටක් වුවද උද්‍යානයක විවිධ ස්ථානවලට ලැබෙන ආලෝක ප්‍රමාණය, සෙවණ ශාක, ගොඩනැගිලි වල සෙවණැල්ල මෙන්ම උද්‍යානය දිශානතිය යන සාධක මත එකි නෙකට වෙනස් වේ.

ලෝකයේ සෙවණ ප්‍රිය කරන හා ආලෝකය ප්‍රියකරන ශාක ලෙස කාණ්ඩ දෙකකි. ශාක ඒවාට ආවේණික බාහිර ලක්ෂණ පෙන්වන්නේ, වඩාත්ම ප්‍රිය කරන පරිසර තත්ව තුල වන අතර, එසේ නොමැති අවස්ථා වල අදාල පරිසර තත්ව වලට අනුව රූපානුදර්ශය වෙනස් කරගෙන පරිසරයේ පැවැත්ම තහවුරු කරගනියි.

(Plectranthus Scutellarioides(L.), කෝලියාස් ඉතා ජනප්‍රිය ,ආලෝකය ප්‍රියකරන උද්‍යාන ශාකයකි. මෙම ශාකයේ විශේෂ තුනක් (3) ක් යොදාගෙන විවිධ සෙවණ තත්ව යටතේ වගා කර සිදුකරණ ලද පයේෂනයක් මගින් ශාක ස්ථානගත කිරීමේදී ආලෝක තත්වය පිළිබඳ අවධානය යොමුකිරීමේ වැදගත්කම අනාවරණය කරගෙන තිබේ. අඛණ්ඩව දින 60ක් කෝලියාස් ශාක 100% සූර්‍යාලෝකයට හා විවිධ සෙවණ තත්ව වලට අනාවරණය කිරීමෙන් ලද ප්‍රතිඵල වලට අනුව ශාක වර්ධනයේ හා භාහිර ස්වරූපයේ සිදු වන වෙනස් වීම් රැසක් අනාවරණය විය. ඉහල සෙවණ තත්ව වලට නිරාවරණය වූ කෝලියාස් ශාක, සූර්‍යාලෝකයේ වර්ධනය වූ ශාක වලට සාපේක්ෂව උස් වූ අතර පත්‍ර ප්‍රමාණයෙන් විශාල නමුත් අඩු පත්‍ර සංඛ්‍යාවක් දරන අතු කීපයක් පමණක් නිරීක්ෂණය විය.




(A) ඇලබාමා සන්සෙට් (B) වෙල්වට් රෙඩ් (C) ෆින්ගර් පේන්ට් යන කෝලියස් විශේෂ 03 හි පැහැය, ප්‍රමාණය විවිධ සෙවණ තත්ව යටතේ යටතේ වෙනස් වන ආකාරය.

ඉහත පයේෂනය මගින් අනාවරණය වූ කරුණක් වූයේ පත්‍ර වල පැහැයටද ආලෝකයේ බලපෑමක් ඇති බවය. පරිගණක යෙදවුමක් මගින් අනාවරණය කරගත් ආකාරයට සූර්‍යාලෝකයට හොඳින් නිරාවරණය වූ පත්‍ර වල රතු වර්ණයේ තීව්‍රතාව හා එහි ප්‍රභලතාව කාලයත් සමග වැඩිවන බවයි. එසේම ඉහළ සෙවණ තත්ව වලට නිරාවරණය වූ ශාක වල කොළ පැහැය වැඩි වූ අතර රතු පැහැයේ තීව්‍රතාවය පැහැදිලි ලෙස අඩු වන අයුරු දක්නට හැකිවිය. මේ අනුව බලන විට, විශේෂයෙන්ම උද්‍යාන ශාක වල අලංකාර පෙනුම සඳහාද ආලෝක තත්වයේ ඉහල බලපෑමක් ඇති බව පැහැදිලි වේ. මේ අනුව ගත් කල ශාක වඩාත්ම සුදුසු පරිසරයක ස්ථානගත කිරීම මගින් උද්‍යාන අලංකරණයේ දීර්ඝකාලීන සුන්දරත්වය රැක ගත හැක.

This is a non-technical summary of the project report titled “Phenotypic Plastic Responses in Morphophysiological Traits of “Three Plectranthus scutellarioides (L.) R. Br (coleus) Varieties in Response to a Light Gradient Continuum” supervised by Prof. C.K. Benaragama*, Department of Crop Science, Faculty of Agriculture, University of Peradeniya.
chalindab@gmail.com



# නීරෝගී සමකට - දේශීය ප්‍රතිකාරයක්

ශසික ධනංජය

විවේකයක් නොමැතිව කසන තුවාල සහිත සතුන් ඔබ දැක තිබේද? මොහොතක් සිතන්න ඔවුන්ට කොපමණ වේදනාවක් ඇතිද, මෙම තුවාල නැවත නැවත ඇතිවීම හා සුව නොවී පැවතීම මගින් මෙම ආසාධිත සතුන් වේදනාවටත් අවිවේකී බවටත් පත් කරන බව ඔබ දන්නවාද? ඔබට සුරතලෙක් සිටීනම් සුරතලා මෙවන් ආසාධනයකින් පීඩා විඳියිනම් ඔබ අනිවාර්යයෙන් ප්‍රතිකාර සිදුකිරීමට පෙළඹෙයි. ඔබ මෙලෙස ප්‍රතිකාර කල සුරතලෙකුගේ හිමිකරුවෙක් නම් ප්‍රතිකාර සඳහා වැයවන අධික වියදම, මෙම තුවාල නැවත මතුවීම, හා ප්‍රතිකාර වලින් අත් වන නොයෙකුත් අහිතකර අතුරු ප්‍රතිඵල පිළිබඳව අත්දැකීම් ඇතැයි මම සිතමි. ශ්‍රී ලංකාව වැනි හෙළ වෙදකම, දේශීය ඖෂධ වලින් පිරිපුන් දිවයිනක ඕනෑම රෝගයක් සඳහා ප්‍රතිකාර සැගවී ඇති බව ඔබ දන්නවාද?



සතුන් පීඩාවට පත්කරන සමේ පවතින බැක්ටීරියා ආසාධන හා ඒවා පාලනය කර ගැනීම හා සම්බන්ධව දේශීය ඖෂධ වල බලපෑම අධ්‍යනය කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය, පශුවෛද්‍ය පීඨය හා එක්ව පරීක්ෂණයක් දියත් කරනු ලැබීය.

අවසන් ප්‍රතිඵල ලෙස,

- සමේ පවතින බැක්ටීරියා ආසාධන දීර්ඝකාලීනව සුව කිරීමටත්, පාලනය කිරීමටත් සමත් දේශීය ඖෂධ වට්ටෝරුවක් අනාවරණය කරගත් අතර
- ඒවා යොදාගෙන දේශීය ඖෂධීය සේදුම් දියරයක් (shampoo)
- ආසාධිත ස්ථාන වල ආලේප කිරීම සඳහා බැක්ටීරියා නාශක දියරයක් නිපදවන ලදී.

නිපදවාගත් සේදුම් දියරය හා ආලේපනය පරීක්ෂණාගාර තුලත් සායනිකව යොදාගනිමිනුත් පරීක්ෂාවට ලක් කල අතර මාස දෙකක් වැනි කෙටි කාලයක් තුල සාර්ථක ප්‍රතිඵල අනාවරණය කර ගන්නා ලදී.

සමේ බැක්ටීරියා ආසාධන සඳහා බහුල වශයෙන් සමේ නිදහස්ව වාසය කරන අවස්ථාවාදී ව්‍යාධිජනක බැක්ටීරියා දායක වන අතර ඔවුන් බහුතරයක් ග්‍රෑම් ධන කාණ්ඩයට අයත් වේග ආසාධන සඳහා බහුලව දායක වන ග්‍රෑම් ධන හා ග්‍රෑම් සෘණ බැක්ටීරියා කාණ්ඩ කිහිපයක් පරීක්ෂණාගාර තත්ව යටතේ වගා කර ඔවුන්ට එරෙහිව සේදුම් දියරය කෙතරම් සාර්ථක ප්‍රතිඵල අත්කර දේ දැයි පරීක්ෂා කල අතර එහිදී ග්‍රෑම් සෘණ බැක්ටීරියා කාණ්ඩ වලට සාපේක්ෂව ග්‍රෑම් ධන බැක්ටීරියා කාණ්ඩ වලට එරෙහිව සේදුම් දියරය වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබාදෙන බව අනාවරණය විය. තවද $50\mu L/mL$ වැනි ඉතා කුඩා සාන්ද්‍රණ මගින් බැක්ටීරියා විනාශ කලහැකි බව ද අනාවරණය කර ගැනුනි. අවසාන වශයෙන් මෙම පරීක්ෂණය සමේ බැක්ටීරියා ආසාධිත සහිත සතුන් 15 දෙනෙක් යොදාගනිමින් පරීක්ෂා කල අතර එහිදී සති දෙකක් වැනි කෙටි කාලයක් තුල සමේ ඇති තුවාල ප්‍රමාණවත් තරම් සුව වූ අතර කැසීම් වැනි හැසිරීම් රටා සම්පූර්ණයෙන්ම සුව වන අයුරු දක්නට ලැබුනිග



මෙම පරීක්ෂණ ප්‍රතිඵල මත තව දුරටත් ගැඹුරු ලෙස මෙම ඖෂධය මත පරීක්ෂණ කටයුතු සිදුකිරීම මගින් අතිශයින්ම සාර්ථක නිෂ්පාදනයක් වෙළඳපලට නිකුත් කල හැකි අතර එහි සුවිශේෂී බව වන්නේ,

- සම්පූර්ණයෙන්ම ස්වාභාවික ඖෂධයක් වීම
- අතුරු ප්‍රතිඵල අවම වීම
- සුරතලාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් වීම
- සාධාරණ මිලකට අලවිකල හැකි වීමයි.



This is a non-technical summary of the project report titled "Indigenous Herbal Shampoo/Lotion for Skin Infections" supervised by Prof. M.B.P. Wijayagunawardane*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya.
missakaw@pdn.ac.lk



# මුල් කිරි පැටවාට පමණයිද?

ශානිකා රාජපක්ෂ







ඕනෑම ක්ෂීරපායි සත්වයෙකු නව ජනිතයෙකු බිහිකල පසු පෝෂණය වෙනුවෙන් කිරි නිපදවීම සිදුකරයි.මෙයිනුත් පලමු දින කිහිපයේදී නිපදවන කිරි අනෙක් දිනවල නිපදවන කිරිවලට වඩා සංයුතියෙන් වෙනස්කම් සහිතයි. මෙම මුල් කිරිවල සාමාන්‍ය කිරිවලට වඩා මිනිස් ශරීරයට හිතකර බැක්ටීරියා වර්ග අඩංගු වේ. ශරීරයට හිතකර බැක්ටීරියා ප්‍රමාණාත්මකව ලබාගැනීම මගින් විවිධ ලෙඩරෝග මගින් ආරක්ෂාව ලබා දෙන අතර ප්‍රතිශක්තිකරණ පද්ධතිය දියුණු කිරීමට උපකාරී වේ. මුල් කිරිවල අඩංගු ප්‍රධාන බැක්ටීරියා වර්ග වන්නේ ලැක්ටොබැසිලි යන ආකාරය වන අතර මෙය දැනට ලෝකයේ බහුලවම භාවිතා වන ලෝක සෞඛ්‍යය සංවිධානය මගින් මිනිස් භාවිතයට සුදුසු බවට තහවුරු කරන ලද බැක්ටීරියා වර්ගයක් වේ.

නමුත් මුල් කිරි සැමවිටම ආහාරයට එක්කර ගැනීමට ඇති නොහැකියාව නිසා විද්‍යාගාරයකදී මෙම බැක්ටීරියා මුල් කිරි මගින් වෙන්කරගෙන ගුණනය කර පසුව භාවිතා කිරීම සඳහා අවශ්‍ය පරිදි සැකසිය හැකි අතර එසේ සකස්කරන බැක්ටීරියා විවිධ ආහාර සමග මුසුකර ආහාරයට ගතහැකි ලෙස සකසා ඇත. මෙසේ සකසන ආහාර ශරීරයට හිතකර බවද විද්‍යාත්මකව තහවුරු කර ඇත.

වර්තමාන ලෝකය තුල රෝග වලක්වාගැනීම සඳහා ඖෂධ භාවිතා කිරීම වෙනුවට ආහාර හා වෙනත් ක්‍රම යොදා ගැනීම බහුලව සිදුකරයි. ශරීරයට හිතකර බැක්ටීරියා සහිත ආහාර අනුභව කිරීමද මෙහි එක් පියවරක් ලෙස දැක්විය හැකිය. එබැවින් මුල් කිරි භාවිතයට ගෙන තත්වයෙන් උසස් ශරීරය හිතකර බැක්ටීරියා නිපදවීම නව විභවයක් ලෙස දැක්විය හැකිය.







This is a non-technical summary of the project report titled “Isolation, Identification and Characterization of Potential Probiotic Bacteria from Cow Colostrum from Sri Lankan Dairy Cattle Farms” supervised by Prof. J.K. Vidanarachchi*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya.
janakvid@pdn.ac.lk



# රෝගකාරක ක්ෂුද්‍රජීවීන් නසනු ලබන දේශීය පාරම්පරික නිවුඩු සහලේ විශ්මිත ප්‍රතික්ෂුද්‍රජීවී ගුණ

අංජලී චානිකා

ශ්‍රී ලංකාව වු කලී ඈත අතීතයේ සිටම සහලින් පෝෂණය වන්නා වු රටකි. පෝෂණ ගුණයෙන සපිරි, ඔසු ගුණයෙන් පිරිපුන් වූ බතක අරුමැසි වරුණ පිළිබඳ වර්තමානයේ බොහෝ පර්යේෂකයන් විසින් පර්යේෂණ පවත්වනු ලබයි. නවීන විද්‍යාත්මක සොයා ගැනිම් වලට අනුව ශ්‍රී ලංකික දේශීය සහල් ප්‍රතිඔක්සිකාරක ගුණයෙන් පොහොසත් වන අතර දියවැඩියාව, පිළිකා, ඉදිමුම් සහ ස්නායු රෝගවලට එරෙහිව ඖෂධයක් ලෙස ක්‍රියාකිරිමේ හැකියාව ද සහිතය. දේශිය සහලේ තවත් එක් අද්වීතිය ගුණයක් වනුයේ ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණයයි.

ඈත අතීතයේ සිටම මිනිසා ඇසට නොපෙනෙන රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් විසින් ඇති කරනු ලබන ආසාදන හෝ වෙනත් රෝග හේතුවෙන් පිඩාවිඳින ලදී. ඇතැම් අවස්ථාවන්හි දි එම රෝග උත්සන්න වී මිනිස් ජිවිතයෙන් වන්දි ගෙවු අවස්ථාද නැතුවාම නොවේ. *Staphylococcus aureus* යනු එවන් ඇසට නොපෙනෙන රෝග කාරක ක්ෂුද්‍ර ජීවීයෙකි. *S. aureus* විසින් ආහාර විෂවීම් ඇති කරනු ලබන අතර එහිදි උදරයේ අධික වේදනාව, ඔක්කාරය සහ වමනය ඇතිවේ. බටහිර විද්‍යාඥයින්/ වෛද්‍යවරුන් විසින් දැනට *S. aureus* ට එරෙහිව විවිධ ස්වරූපයේ ප්‍රතිජීවික ඖෂධ නිපදවා තිබුන ද ඒවායේ ඵලදායීතාවය ශූන්‍ය කරමින් ඒවා අභිබවා යාමට *S. aureus* ට හැකි වී තිබේ. එවන් පසුබිමක නව, ස්වාභාවික ප්‍රතික්ෂුද්‍ර ජීවී කාරකයක ඇති අවශයතාවය කොතරම් ද යත් ඔබට නිසැකවම අවබෝධවනු ඇත.

දේශීය මෙන් ම බටහිර වෛද්‍ය මතය අනුව පෝෂණීය සහ ඖෂධ ගුණයෙන් ඉහළ නිවුඩු සහලෙන් ඉදුණු බතය. සහල් පැහිමේදී කුරුට්ට අනවශ්‍ය ද්‍රව්‍යයක් ලෙස ඉවත් කළ ද එය පෝෂණීය සහ ඖෂධීය ගුණයෙන් පිරිපුන් බව නවීන විද්‍යාව මගින් සනාථ වී ඇත.

මෙම ලිපිය මගින් ප්‍රධාන ලෙසම ශ්‍රි ලාංකික දේශිය සහල් දෙවර්ගයක (කුරුට්ට සහිත) ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ පිළිබඳ සලකා බලනු ලබන අතරම ඒවායේ ප්‍රබලතාවය වැඩි දියුණු කළ ප්‍රභේද සමග සසඳා බැලීමක් ද කෙරුණු ලැබේ. කළුහීනටි යනු තද රෝස පැහැති බතක් ඇති ඖෂධීය ගුණයෙන් අනූන දේශීය සහලකි. කළුහිනටි සහලේ S. aureus ට එරෙහිව ඇති ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණද ඉතාම ඉහළ මට්ටමක පවතී.

පච්චපෙරුමාල් සහලේ ද *S. aureus* ට එරෙහිව ක්‍රියාකරනු ලබන ප්‍රතික්ෂුද්‍රජීවී ගුණ බොහෝ ය. මෙම සහල් දෙව්රගයම ග්‍රෑම් කිහිපයක් පමණක්වු කුඩා මාත්‍රාවකින් *S. aureus* මරණයට පත්කිරිමේ හැකියාව විශ්මය ජනකය. පච්චපෙරුමාල් සමග සැසඳීමේ දී කළුහීනටිවල ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණය ඉතා ඉහළ වන අතර සමස්තයක් ලෙස ගත් කල ශ්‍රී ලාංකීක පාරම්පාරික රතු සහල් ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ වලින් ඉතා පොහොසත් ය. දේශීය සහලේ ඇති (කුරුට්ට් සහිත) අධික ජෛව ක්‍රියාකාරි සංයෝග මෙයට හේතු කාරක වී ඇත.

නිපදවෙන සහල් වල ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ පාරම්පාරික දේශිය සහල් හා සැසඳීමේ දී ඉතා අල්ප ය. එමෙන්ම රතු සහල්වල (දේශීය හෝ වැඩිදියුණු කළ සහල්) ප්‍රතික්ෂුද්‍රජීවී ගුණ සුදු සහල් වලට වඩා වැඩිය. රතු සහල් කුරුට්ටේ ඇති ඇතැම් ජෛව ක්‍රියාකාරි සංයෝග මෙයට හේතු කාරක වී ඇත. මින් හෙළිදරව් වන වැදගත්ම කාරණා වනුයේ,

- දේශීය පාරම්පාරික සහලේ (කළුහිනටි සහ පච්චපෙරුමාල්) ඇති විශ්මිත ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ
- පාහින ලද සහල් වලට වඩා නිවුඩු සහලේ ඇති විශ්මිත ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ
- සුදු සහල් වලට වඩා රතු සහල් වල ඇති විශ්මිත ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණ පිළිබඳ නොවේ ද?

එබැවින් *S. aureus* විසින් නිපදවනු ලබන රෝගවලට එරෙහිව ස්වාභාවික සහ ආරක්ෂිත ප්‍රතික්ෂුද්‍ර ජීවී කාරක ප්‍රභවයක් ලෙස දේශීය පාරම්පාරික රතු නිවුඩු සහල් භාවිතා කළ හැක.

